## පිරිසිදු කිරීම

දුම් සහ ජලය මගින් ඔබගේ නිවාසය සහ එහි අඩංගු දේපලවලට අලාභ හානි විය හැකිය. ඔබට රක්ෂණ ආවරණයක් ඇතිනම්, ඔබගේ රක්ෂණ සමාගම / හානි සීරුමාරු කරන අය (ඔබගේ ඉල්ලීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට රක්ෂණ සමාගමෙන් පත් කරන අය) විසින් පිරිසිදු කිරීමට සහ අලාභහානිවූ අයිතමයන් සහ භාණ්ඩ බේරා ගැනීමට සහ ඉවත් කිරීමට විශේෂඥ සමාගම් පිළියෙල කර දීම මගින් ඔබට උපකාර කරනු ඇත.

රශ්මියෙන්, දුමෙන් හෝ ජලයෙන් බලපෑම් ඇතිවුන මුත් හොඳින් ඇති සමහර අයිතමයන් ඔබ හට බේරා ගත හැකිය. දේපලවලට සිදුවූ හානිය ඇසට පෙනෙන හානියට ඔබ්බෙන් යාමට හැකි බව මතක තබා ගන්න. දුම් සහ දැලි වෙනත් කාමරවලට ගොස් එවායේ බිත්ති, කාර්පට්, අප්හෝල්ස්ට්‍රි, කර්ටන්, ඇඳුම් සහ වෙනත් ඕනෑම භාණ්ඩයක් තුලට යා හැක.

පිරිසිදු කිරීම සම්බන්ධ සාමාන්‍ය හෝඩුවාවන් මෙන්නඃ

- ඇතුලත ඇති වාතය එහා මෙහා යාමට සලසන්න. වාතාශ්‍රය ලබාගැනීමට ජනේල විවර කරන්න. වාතය එහා මෙහා යැවීමට විදුලි පංකාවක් භාවිතා කරන්න
- තෙත භාණ්ඩ හැකි විගස වේලා ගන්න
- සේදීමට නොහැකි ඇඳුම් සහ කර්ටන් ඩ්‍රයි ක්ලීනර් කෙනෙකු වෙත ගෙන යන්න
- සාමාන්‍ය ඇඳුම් ඩිටර්ජන් භාවිතා කර මඳ උණුසුම් ජලයේ සෝදා ගන්න
- බිත්ති, ගෘහ භාණ්ඩ සහ පොළොවෙන් දුම් සහ දැලි ඉවත් කිරීමට රබර් අත්වැසුම් පැලද ඩිටර්ජන්ට් යොදා සෝදා ගන්න.
- ගින්නට හෝ ජලයට නිරාවරණයවුණු විදුලි උපකරණ භාවිතයට පෙර විදුලි කාර්මිකයෙකු හෝ බලයලත් සේවා කාර්මිකයෙකු ලවා පරීක්ෂා කරවා ගන්න

## උපකාර

ඔබට උපකාර ලබාදිය හැකි පවුලේ අය, මිතුරන් හෝ අසල්වාසීන් නොමැතිනම්, ඔබ හට උපකාර ලබා ගැනීමට සුදුසුකම් තිබිය හැකිය. පහත සංවිධාන මගින් ඔබ හට උපකාර ලබාදීමට හැකියාව ඇතඃ

**පළාත් කවුන්සිලයේ මිනුසිපල් රිකවරි (Municipal Recovery) කළමණාකරු**
පළාත් ප්‍රජා උපකාර සේවා සම්බන්ධ උපදෙස් සඳහා

**වික්ටෝරියන් එමර්ජන්සි (Victorian Emergency) නැවත යථා තත්වයට පත්වීමේ දුරකථන අංකය**
(දුෂ්කරතා උපකාර සම්බන්ධ)
දුඃ **1300 799 232**

**රජයේ නිවාස කුලියට ගත් නිවාස සහ ප්‍රජා ගොඩනැගිලි කාර්‍යාලය (DHHS)**
දුඃ **13 11 72**
(පැය 24 සේවාව)

**ආර්.එස්.පී.සී.ඒ. (RSPCA)**
දුඃ **9224 2222**

**වික්ටෝරියානු පාරිභෝගික කටයුතු (Consumer Affairs Victoria)**
ඔබ කුලී නිවෙසක සිටිනම් ඔබගේ කුලී ගිවිසුම අවසන් කිරීමට හෝ අඩුකල කුලියකට සිටීමට ඉඩකඩ ඇත.
දුඃ **1300 558 181**

**ලයිෆ්ලයින් (Lifeline)**
උපදේශක සේවා සහ චිත්තවේගී උපකාර සඳහා
දුඃ **13 11 14**
(පැය 24 සේවාව)

**පරිවර්තන සහ තෝල්ක සේවාව (Translating and interpreting service)**
දුඃ **13 14 50**

**සෙන්ටර්ලින්ක් (Centrelink)**
(විශේෂ අවස්ථානුගත කරුණු යටතේ උපකාර සඳහා)
දුඃ **13 28 50**

**cfa.vic.gov.au/afterthefire/**

## සෝදිසි ලැයිස්තුව

ගින්නකට පසු සෝදිසි ලැයිස්තුවඃ

- ☐ ඔබගේ නිවසේ රැඳී සිටීමට සුදුසුද නැතිනම් ඔබ එයින් පිටත්ව යා යුතුද යන්න ගිනි සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරියාගෙන් (Fire Officer in Charge) විමසා දැන ගන්න
- ☐ ඔබ හට රැඳී සිටීමට හැකිනම්, ගෑස්, විදුලිය, ජලය සහ දුරකථන සපයන ආයතන හා සම්බන්ධවී එම සම්බන්ධතා නැවත ලබා ගන්න
- ☐ භාණ්ඩ සහ ගොඩනැගිලි සම්බන්ධ රක්ෂණ උපදෙස් සඳහා ඔබගේ රක්ෂණ සමාගම හා සම්බන්ධ වන්න
- ☐ ඔබ කුලී නිවසක සිටීනම් ඔබගේ නිවෙස් හිමියා හට දැනුම් දෙන්න
- ☐ ඔබගේ නිවස තවදුරටත් කාලගුණය, මිනිසුන් විසින් හෝ සොරු මගින් අලාභහානි වීමෙන් ආරක්ෂා කර ගන්න

ඔබ නිවසින් පිටත්ව යන්නේ නම්ඃ

- නැවතී සිටීමට තැනක් පිළියෙල කර ගන්න
- ඔබට අවශ්‍ය පුද්ගලික දේ ඔබ සමඟ රැගෙන යන්න (පොත් පිංචේ ඇති නිර්දේශිත ලැයිස්තුව බලන්න)
- ගෑස්, විදුලි, ජල සහ දුරකථන සේවා සපයන අය හා සම්බන්ධවී එම සේවා අවලංගු කරගන්න
- සියළුම නිවෙසට ගෙනත් භාරදෙන සේවා අවලංගු කරන්න (උදාඃ ලිපි නැවත යොමු කිරීම සඳහා ඕස්ට්‍රේලියා පෝස්ට්, පුවත්පත්)
- ඔබගේ සේවායෝජකයා, දරුවන්ගේ පාසල, රක්ෂණ සමාගම සහ අසල්වාසීන් වැනි වැදගත් අය හට ඔබගේ වෙනස්වූ ලිපිනය දැනුම් දෙන්න
- පළාතේ පොලීසිය හා සම්බන්ධවී, ඔබගේ දේපළ ගින්නෙන් හානිවී ඇති අතර දැනට එහි කිසිවෙක් නැති බවට දැනුම් දෙන්න

P049 4/16

# ගින්නකට පසුව

මෙම තොරතුරු ඔබට ගින්නකට පසුව උපකාරීවේ.



පරිවර්තන සහ තෝල්ක සේවා (Translating and Interpreting Service)
දුරකථන අංකයඃ 13 14 50

## ඔබගේ නිවසේ සිටීම ආරක්ෂාකාරීද?

ගින්නකට හෝ වෙනත් ආපදාවකට පසු ඔබ එම නිවසේ සිටීම ආරක්ෂාකාරී නොවිය හැකිය. ගිනි සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරියා විසින් ඔබට එසේ සිටීම ආරක්ෂාකාරීද යන්න උපදෙස් ලබා දෙනු ඇත. සමහර අවස්ථාවල ගිනි සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරියා විසින් පළාත් පාලන ආයතනයේ ගොඩනැගිලි පරීක්ෂකවරයා අමතා අදාල ගොඩනැගිල්ලේ ආරක්ෂාව ඇගයීමකට ලක්කරන ලෙස ඉල්ලා සිටීම අවශ්‍යවේ.

## ගෑස්, විදුලිය, ජලය සහ දුරකථන

ගින්නක් හේතුවෙන් ගෑස්, විදුලිය, ජල සැපයුම හෝ දුරකථන මාර්ගවලට අලාභහානි සිදුවීම, විනාශවීම හෝ ගිනි නිවන අය හෝ අදාල සේවා සපයන අය මගින් විසන්ධි කර තිබිය හැකිය.

අදාල සේවාවන් පරීක්ෂා කරවාගෙන සුදුසුකම් ලත් වෘත්තීයකයෙකු ලවා එවා අළුත්වැඩියා කරගෙන අදාල සේවා සපයන්නා ලවා එවා නැවත සම්බන්ධ කර ගැනීම දේපළ අයිතිකරුගේ වගකීමවේ.



## දේපළවල ආරක්ෂාව




ආපදා සේවා මගින් සිය රාජකාරී කටයුතු අවසන් කල පසු, දේපළ ඔබට නැවත භාරදෙනු ඇත.

ඉන්පසු ඔබගේ දේපලෙහි ආරක්ෂාව සම්බන්ධයෙන් ඔබ වගකිවයුතුවේ.

ඔබගේ දේපළ තවදුරටත් දේශගුණය, සොරකම්, මිනිසුන් විසින් කරන හානිවලින් ආරක්ෂා කර ගැනීම අවශ්‍යවේ. ඔබගේ නිවස ආරක්ෂා කර ගැනීම සඳහා තාවකාලික වැටවල් ගසන අයගේ සේවා ලබා ගැනීමට ඔබට අවශ්‍ය විය හැකිය.


ඔබ ජීවත් වන්නේ කුලී නිවසක නම්, ඔබගේ නිවාස දේපළ නියෝජිතයා/කුලී නිවෙස් හිමියා හට දැනුම්දී නිවෙස ආරක්ෂාකාරී කරගත යුතුය.

ආපදා අවස්ථාවෙන් පසු ඔබ විසින් ඔබගේ දේපළ ආරක්ෂා නොකර ගැනීම හේතුවෙන් සිදුවන අලාභහානි සම්බන්ධයෙන් රක්ෂණ සමාගම විසින් වගකීම ප්‍රතික්ෂේප කල හැකි බව හොඳින් අවබෝධ කර ගන්න. ඔබගේ දේපළ ආරක්ෂා කර ගැනීම සඳහා ඔබගේ රක්ෂණ සමාගම විසින් ඔබට උපකාර කල හැකිය.

## රක්ෂණ ආවරණය

ඔබට දේපළ හෝ භාණ්ඩ රක්ෂණ ආවරණයක් ඇතිනම්, ගින්නෙන් අනතුරුව වහාම ඔබගේ රක්ෂණ සමාගම හා සම්බන්ධ විය යුතුය.

- ඔබ විසින් ගතයුතු පියවර සම්බන්ධ උපදෙස් ඔබගේ රක්ෂණ සමාගමෙන් ලබා ගන්න
- ඔබගේ රක්ෂණ සමාගම හා පළමුවෙන් කථා නොකර අලාභහානිවුනු කිසිවක් ඉවත නොදමන්න
- අලාභහානිවුනු දේවල ලැයිස්තුවක් තබාගෙන හැකිනම් එවායේ ඡායාරූපද ලඟ තබා ගන්න
- හදිසියේ කල අළුත්වැඩියා කටයුතුවල රිසිට්පත් ලඟ තබා ගන්න
- ඔබට ආපදා ඉදුම් හිටුම් ලබාදෙනවාද යන්න ඔබගේ රක්ෂණ සමාගම වෙතින් දැනගන්න



## ඔබගේ නිවසේ රැඳී සිටීමට නොහැකි නම්

ඔබ නිවසින් පිටත්ව යාමට පෙර ගිනි සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරියාගෙන් විමසා නිවසට ඇතුළුවීම ආරක්ෂාකාරීද යන්න සොයා බලන්න. එසේ ඇතුලට යාම ආරක්ෂාකාරී නම්, ඔබ විසින් පහත දේ රැගෙන යාම නිර්දේශ කෙරේ.

- හඳුනා ගැනීමේ ලේඛණ - රියදුරු බලපත්‍රය, මෙඩිකෙයාර් කාඩ්පත, ගමන් බලපත්‍රය
- රක්ෂණ සමාගම සහ පොලිසිය සමඟ සම්බන්ධවීමේ තොරතුරු
- ක්‍රෙඩිට් කඩ්පත්, චෙක් පොත්
- බෙහෙත් සහ බෙහෙත් වට්ටෝරු (උණුසුමට සහ දුම්වලට නිරාවරණය වුණු බෙහෙත් ඉවත දැමිය යුතුය)
- පුද්ගලික උපකාර උපකරණ - ගමන් කිරීම සඳහා ඇති ආධාරක, ඇස් කණ්නාඩි, ශ්‍රවණාධාර
- වටිනා දේ - ස්වර්ණාභරණ, ඡායාරූප, මුදල්, ලැප්ටොප්, ආදිය
- නීති ලියකියවිලි
- වාහන යතුරු සහ නිවසේ යතුරු
- ජංගම දුරකථනය සහ චාජරය

## නැවතීමට යන ස්ථානය

ඔබට ඔබගේ දේපලෙහි රැඳී සිටීමට නොහැකිනම්, හොඳම විකල්පයන් වන්නේ වෙනත් පවුලේ උදවිය, මිතුරන් හෝ අසල්වාසීන් සමඟ සිටීමයි. සමහර රක්ෂණ ආවරණ මගින් ඉදුම් හිටුම් සඳහා යන වියදමද ආවරණය කරනු ඇත.